# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 12,205—1960 සැප්තැම්බර් 23 වැනි සිකුරාදා—23.9.1960**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 191 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | 194 | අය-වැය ලේඛන ... ... | 197 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — | මාගී කොම්පි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් | — | විවිධ දැන්වීම් ... ... | 198 |


## පළාත් පාලන නිවේදන

ඇල්. ජී. ඞී. ජීසී. 14/42.

### 1950හේ අංක 19 දරන විදුලි බලය පිළිබඳ ආඥාපණත

කෘෂිකර්ම ඉඩම් වාරිමාර්ග සහ විදුලිබලය පිළිබඳ අමාත්‍යතුමාගෙන් විමසා පළාත් පාලනය හා නිවාස පිළිබඳ අමාත්‍යතුමා විසින් දෙනලද අනුමතිය ඇතිව, හළාවත දිස්ත්‍රික්කයේ ඕතර පළාත ගම් ප්‍රදේශයේ ගම්කාර්යසභාව විසින් 1950හේ අංක 19 දරන විදුලි බලය පිළිබඳ ආඥාපනතේ 46 වන වගන්තිය යටතේ සම්පාදිතවූ නියෝග.

වී. සී. ජයසූරිය,
පළාත් පාලනය සහ නිවාස පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 සැප්තැම්බර් මස 13 වැනි දින,
කොළඹ.

**නියෝග**

1. මේ නියෝගවල—

"ආඥාපනත" යනුවෙන් 1950හේ අංක 19 දරන විදුලි බලය පිළිබඳ ආඥාපනත අදහස් කරනු ලැබේ.

"බලපත්‍රය" යනුවෙන් ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ හළාවත දිස්ත්‍රික්කයේ ඕතර පළාත ගම් ප්‍රදේශයේ ගම්කාර්යසභාව වෙත නිකුත් කරන ලද බලපත්‍රය අදහස් කරනු ලැබේ.

"බලපත්‍රධාරියා" යනුවෙන් හළාවත දිස්ත්‍රික්කයේ ඕතර පළාත ගම් ප්‍රදේශයේ ගම්කාර්යසභාව අදහස් කරනු ලැබේ.

2. තම ප්‍රයෝජනය පිණිස බලපත්‍රධාරියාගෙන් විදුලි බලය ලබා ගැනීමට බලාපොරොත්තුවන ඕනෑම කෙනෙකු විසින්—

(අ) විදුලි බලය ලබාගැනීමට ඕනෑකරන දිනට යටත් පිරිසෙයින් දවස් දහහතරකට මත්තෙන් ඒ සඳහා බලපත්‍රධාරියා විසින් සපයනු ලබන පෝර්මයේ ප්‍රකාරයට ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතුවාත් හැර,

(ආ) ඕනෑම කෙනෙකු විසින් විද්‍යුත් වේගවාහක කම්බිය සඳහා ගාස්තු බලපත්‍රධාරියා වෙත කලින් ගෙවිය යුතුවාත් හැර, බලපත්‍රධාරියාට අවශ්‍යවන්නේ නම් ආඥාපනතේ 33 වැනි වගන්තිය යටතේ බලපත්‍රධාරියා සමග ලියවිල්ලකින් වූ ගිවිසුමකටද ඇතුලත්විය යුතුය.

3. විදුලි බලය පාවිච්චිකරන සෑම පාරිභෝගියකු විසින්ම බලපත්‍රයේ සඳහන් කරන ලද රේට් ගණන් අනුව එකී විදුලි බලය සඳහා මුදල් ගෙවිය යුතුය.

4. (1) පාරිභෝගිකයාට අයත් භූමි භාගයෙහි පිහිටුවා තිබෙන විද්‍යුත් වේගවාහක කම්බියේ කොටස හා විදුලි බලය වෙනස්කරන උපකරණද, ප්‍රධාන ගිනි නූල් සහ විද්‍යුත් මාපකයද, විදුලි යතුරු පුවරුද බලපත්‍රධාරියාගේ දේපල වශයෙන් සැළකිය යුතුවාත් හැර බලපත්‍රධාරියාගෙන් අවසර ලත් සේවකයකු හැර වෙන කිසිම කෙනෙකු විසින් මොනම කාරණයක් සඳහාවත් ඒවා වෙනස්කිරීම හෝ අතපතගෑම හෝ නොකළ යුතුයි.

(2) පාරිභෝගිකයා විසින් ස්වකීය පාර්ශ්වයේ ඇත්තාවූ බලපත්‍රධාරියාගේ ප්‍රධාන ගිනි නූලේ හෝ මීටරයේ කම්බි, විදුලි කම්බි හා උපකරණ නඩත්තු කිරීම ගැන වගකිව යුතුය.

(3) ආඥාපනතේ 47 (3) වැනි වගන්තිය යටතේ අසම්බන්ධ කරන ලද විදුලි සේවයක් නැවත සම්බන්ධ කිරීමේදී එය සෝදිසිකර බැලීම හා නැවත සම්බන්ධ කිරීම සඳහා බලපත්‍රයේ සඳහන් ප්‍රකාර ගාස්තුවක් පාරිභෝගිකයා විසින් කලින් ගෙවිය යුතුය. නැතහොත් ඔහුගෙන් අයකළ යුතුය.

(4) කිසියම් පාරිභෝගිකයකුගේ විදුලි කම්බිවල හෝ සවිකිරීම්වල ඇතැම් කොටසකින් විදුලි බලය කාන්දුවීමක් සිදුවන විට සවකීය ස්ථානයේ එසේ කාන්දුවියන මීටරයේ සඳහන් සියලුම විදුලි බලය සඳහා පාරිභෝගිකයා විසින් මුදල් ගෙවිය යුතුය.

5 (1) තමාට විදුලි බලය සැපයුවාට පසු යම්විටෙක යම්කිසි ලාම්පුවක් හෝ පංකාවක් හෝ දැනට පාවිච්චි කරන මීටරයට වඩා විශාලවූ මීටරයක් පාවිච්චි කිරීමට හෝ වැඩිපුර යම්කිසි ලාම්පුවක් හෝ නිත්‍ය

වශයෙන් හෝ තාවකාලික වශයෙන් විද්‍යුත් ප්‍රවාහයෙන් ක්‍රියා කරන උපකරණයක් සවිකිරීමට හෝ තමාගේ දේපලෙහි ඇද තිබෙන විදුලි කම්බි කොයි අත් දමකින් නමුත් වෙනස් කිරීමට හෝ දික් කිරීමට හෝ අදහස් කරන සෑම පාරිභොගිකයකු විසින්ම එබඳු දික් කිරීමක් හෝ වෙනස් කිරීමක් පිළිබඳ කටයුතු ආරම්භ කිරීමට යටත් පිරිසෙයින් දින දෙකකටවත් මත්තෙන් විදුලි කර්මාන්ත පිළිබඳ කොන්තරාත්කරුවාගේ නම සහ ලිපිනය ද සමග ඒ බව බලපත්‍රධාරියාට ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

(2) කිසිම පාරිභොගිකයකු විසින් කිසියම් දීර්ඝකිරීමක්, ලාම්පුවක් හෝ පංකාවක් හෝ දැනට පාවිච්චි කරන මීටරයකට වඩා විශාලවූ මීටරයක් පාවිච්චි කිරීමට හෝ වැඩිපුර යම්කිසි ලාම්පුවක් හෝ නිත්‍ය වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ විද්‍යුත් ප්‍රවාහනයෙන් ක්‍රියා කරන උපකරණයක් විද්‍යුත් වේගවාහක ප්‍රධාන කම්බියට සවිකිරීම හෝ බලපත්‍රධාරීයා විසින් ඒ සඳහා බලය පවරන ලද නිලධාරියකු විසින් පරීක්ෂාකොට හා විභාගකොට බලා සතුටුදායකයයි ඒත්තුගතහොත් මිස, නැත්නම් එකී දීර්ඝකිරීම, ලාම්පුව, පංකාව, මීටරය, වැඩිපුර ලාම්පු හෝ වෙනත් උපකරණ සවි නොකළ යුතුයි.

6. (1) යම්කිසි ස්ථානයක බලපත්‍රධාරියාගේ ප්‍රධාන ගිනි නූල උණුවී යනු ලබන්නේ නම් පාරිභොගිකයා විසින් ඒ බව වහාම බලපත්‍රධාරියාගේ විද්‍යුද්පාදකාගාරය හෝ උප විද්‍යුත් පාදකාගාරය භාර නිලධාරියා වෙත ඒ කාරණයේ හැටියට දැනුම්දිය යුතුයි.

(2) බලපත්‍රධාරියා විසින් බලය දෙනලද නිලධාරියෙකුගෙන් හෝ බලපත්‍රධාරියා විසින් රක්ෂාවෙහි යොදවාගෙන සිටින වැඩකරුවෙකුගෙන් බාහිරවූ කිසිවකු විසින් බලපත්‍රධාරියාගේ දේපළ වශයෙන් සළකනු ලබන උණුවීගිය ගිනි නූල වෙනුවට වෙනින් ගිනි නූලක් දැමිය යුතු නැත.

(3) පාරිභොගිකයාගේ හෝ බලපත්‍රධාරියාගේ හෝ දේපල වශයෙන් සලකනු ලබන යම් කිසි ගිනි නූලක් දැමීමට බලපත්‍රධාරියාගේ යම් නිලධාරියෙකුගේ හෝ කම්කරුවෙකුගේ හෝ සේවය වුවමනා කරන්නේ නම්, ඒ සඳහා ගෙවියයුතු බලපත්‍රයේ සඳහන් නියම ගාස්තුව පාරිභෝගිකයාගේ මාසික ගණන් හිලව් වල ඇතුලත් කළ යුතුය.

7. සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් හෝ විදුලි බලය සැපයීමේදී සිදුවෙන බාධා හේතුකොටගෙන නියම වශයෙන් හෝ අනියම් වශයෙන් හෝ සිදුවෙන පාඩුවක් හෝ අලාභහානියක් සම්බන්ධයෙන් බලපත්‍රධාරියා පාරිභෝගිකයාට වග නොකියයි.

8. ආඥාපනතේ 45 වන වගන්තිය යටතේ අසම්බන්ධකොට තිබුනාවූ සේවයක් නැවත සම්බන්ධ කරන කල්හි හරිවැරදි සෝදිසිකොට නැවත සම්බන්ධකිරීම සඳහා බලපත්‍රයේ සඳහන් ගාස්තුව අයකළ යුතුවාත් හැර, එය පාරිභෝගිකයා විසින් කලින් ගෙවිය යුතුද වන්නේ ය.

9. (1) සියලුම ගාස්තු ගනුදෙනු ඉදිරිපත් කරන දිනයට අයවිය යුතුව තිබෙන්නා සේ සළකනු ලැබේ.

(2) ගනුදෙනු පිළිබඳවූ යම් පැමිණිල්ලක් එකී ගනුදෙනු ඉදිරිපත් කොට සතියක් ඇතුලතදී කරන ලද්දේ නම් මිස නැත්නම්, ගනුදෙනු වල වැරදි පිළිබඳවූ කිසිම පැමිණිල්ලක් බලපත්‍රධාරියා විසින් භාරගනු නොලැබේ.

10. (1) ස්වකීය පදිංචි ස්ථානය සඳහා විදුලි බලය අනවශ්‍යයි අදහස් කරන සෑම පාරිභෝගිකයෙකු විසින්ම ඒ බව තුන් දවසකට කලින් බලපත්‍රධාරියාවෙත ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

(2) (1) ඡේදයේ සඳහන් පරිදි එසේ දැනුම් දීමක් කර නොමැති කල්හි, විදුලි බලය අනවශ්‍ය බව දන්වමින් බලපත්‍රධාරියාට දැන්වීම ලැබුණු දින සිට දවස් තුනක් ගතවනතුරු තමා පදිංචි ස්ථානයේවූ බලපත්‍රධාරියාගේ උපකරණ සම්බන්ධයෙන් පාරිභෝගිකයා වග කිවයුතු අතර ඒ ස්ථානයේ පාවිච්චි කරන්ට යෙදුනු සියලු විදුලි බලය සම්බන්ධයෙන් පාරිභොගිකයා ගාස්තුද ගෙවිය යුතුය. එහෙත්, එකී දවස්තුන අවසාන වන්ට මත්තෙන් බලපත්‍රධාරියා විසින් සේවය අසම්බන්ධ කරන ලද්දේ නම්, ඒ ස්ථානයේ පාවිච්චිකරන විදුලි බලය සම්බන්ධයෙන් පාරිභොගිකයා ගාස්තු ගෙවිය යුත්තේ එසේ අසම්බන්ධ කළ වේලාව දක්වා පමණකි.

11. කිසිම පාරිභෝගිකයකු විසින්—

(අ) රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු හා කෘත්‍යාධිකාරී මහතා විසින් විදුලි කටයුතු කරගෙනයාමට අවශ්‍ය ප්‍රාගුන්‍ය ඇතැයිකියා සහතික කරන ලද්දාවූ හෝ අනුඥාත විදුලි කටයුතු පිළිබඳ වැඩපොළක හෝ වෙළඳ සමාගමක හෝ විදුලි බල ස්ථානයක යටත්පිරිසෙයින් අවුරුදු තුනක්වත් ප්‍රායෝගික කෘතහස්තාවක් ලබා ඇත්තාවූ, හෝ

(ආ) අවුරුදු දෙකකට නොඅඩු කාල පරිච්ඡේදයක් තුල නොකඩවා විදුලි කටයුතු පිළිබඳ ඉංජිනේරු කර්මාන්තයෙහි ව්‍යාවෘතව සිටියාවූ, හෝ

කෙනෙකු නොවන කවරෙකු වුවත්—

(අ) බලපත්‍රධාරියාගේ විදුලි සම්පාදක සංදාමයට සම්බන්ධකිරීමට අදහස් කරන්නාවූ පාරිභෝගිකයාගේ යම්කිසි දේපලක පිහිටි යම්කිසි උපකරණ සමුච්චයකට අදාලවන්නාවූද කම්බි දැමීම හෝ විදුලි උපකරණ හෝ දේවල් සවිකිරීම පිළිබඳවූ කවර කටයුත්තක් කරගෙනයාම සඳහා, හෝ

(ආ) පාරිභෝගිකයාගේ යම්කිසි දේපලක පිහිටි විදුලි උපකරණ සමුච්චිය සම්බන්ධයෙන් බලපත්‍රකාරයාගේ විදුලි සම්පාදක සංදාමයට එකී උපකරණ සමුච්චිය සම්බන්ධ කළාට පසු,

(1) එකී උපකරණ සමුච්චිය වෙනස්කිරීම හෝ හරිගැස්සීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම හෝ ඊට අලුතෙන් කෑලි දැමීම යන මෙසින් සංයුක්තවූ හෝ ස්වභාවයෙන් ඒ හා සමානවූ කිසිම විදුලි කර්මාන්තයක්, හෝ

(2) එකී උපකරණ සමුච්චියේ ස්වභාවයක් භාරයක් කිසිම විධියකින් වෙනස් නොකරන්නාවූ නොහොත් ඊට හානිකර නොවන්නාවූ ප්‍රකාරයට ලාම්පු, පංකා, විදුලි යතුරු හෝ වෙනත් සංයෝජන කොටස් වෙනුවට සාමාන්‍යයෙන් අලුත් ඒවා දැමීම හැර වෙන කිසිම විදුලි කර්මාන්තයක් කිරීම සඳහා, හෝ

නොයෙදවිය යුතුයි.

12. (1) යෝජනාකර තිබෙන කර්මාන්තය බලපත්‍රධාරියාගේ නිලධාරියෙකුට පරීක්ෂාකර බැලීමට හැකිවෙන පරිද්දෙන් ඒ පිළිබඳ දවස් දෙකකට නොඅඩු දින ගණනකට කලින් දැනුම්දීමෙන් පසුව මිස නැත්නම්, එවකට සවිකොට තිබෙන විදුලි කම්බි, යන්ත්‍ර සූත්‍ර උපකරණ ආදිය වෙනස්කිරීම හෝ ඒවාට අමුතුවෙන් යමක් එකතු කිරීම හෝ ඒවා හරිගැස්සීම ඇතුලුව විදුලි කම්බි, යන්ත්‍ර සූත්‍ර, උපකරණ ආදිය සවිකිරීම වැනිවූ කිසිම විදුලි කර්මාන්තයක් ආරම්භ කිරීම නොකට යුතුයි.

(2) යෝජනා කරන ලද කර්මාන්තය (1) වැනි ඡේදයේ සඳහන් නිලධාරියා අනුමත කරතොත් ඔහු විසින් විද්‍යුත් මාපකය සවිකළ යුතු ස්ථානය කොන්ත්‍රාත්කරුවා සමග සාකච්ඡාකොට නියම කරනු ඇත. කොන්ත්‍රාත්කරුවා විසින් ආඥාපනතේ 60 වන වගන්තිය යටතේ ඒ සඳහා සම්පාදනය කරනු ලබන යම් යම් නියෝගවලට අනුකූලව ඒ කර්මාන්තය කරගෙන යා යුතුයි.

13. (1) 12 වැනි නියෝගයෙහි සඳහන් යම් විදුලි කර්මාන්තයක් සම්පූර්ණකළවිට බලපත්‍රධාරියා විසින් ඒ සඳහා බලය දෙනලද නිලධාරියෙකු විසින් එකී කර්මාන්තය පරීක්ෂාකොට හා සෝදිසිකොට බලා—

(අ) විදුලිකම්බි ආදිය සවිකිරීම නියමිතවූ නියෝගවලට එකඟව පවත්නේ නම් ඒ ස්ථානයට විදුලි බලය සපයනු ලැබෙනවාත් හැර,

(ආ) විදුලි කම්බි ආදිය සවිකිරීම නියමිතවූ නියෝගවලට එකඟව නොපවත්නේ නම්, විදුලි කම්බි ආදිය සවිකිරීම එකී නියෝගවලට එකඟවන පරිද්දෙන් සකස්කරනතුරු විදුලි බලය සපයනු නොලැබේ.

(2) මේ නියෝග යටතේ කිසියම් කම්බි සවිකිරීමක් පරීක්ෂාකර බැලීම හා සෝදිසිකරබැලීම සඳහා ගෙවියයුතු ගාස්තු පාරිභෝගිකයා විසින් කලින් ගෙවිය යුතුය.

14. බලපත්‍රධාරියාවෙත දැන්වීමක් නොකරනුලැබ හා ඔහුගේ අනුමැතිය කලින් ලබානොගෙන කිසියම් ස්ථානයක අලුතෙන් විදුලි උපකරණ සවිකිරීමක් සම්බන්ධයෙන්වූ යම් වැඩක් කරගෙනයන්නේ නම්, බලපත්‍රධාරියා විසින් එකී විදුලි කර්මාන්තය කරගෙනයන ලද ස්ථානයට විදුලි බලය සැපයීම ප්‍රතික්ෂෙප කරන හැකිය. එසේ නැත හොත් බලපත්‍රධාරියා විසින් බලපත්‍රය දෙනලද නිලධාරියා විසින් අවශ්‍ය යැයි අදහස් කරන පරිද්දෙන් විදුලි කම්බි ඇද තිබෙන හැටි වෙනස් කිරීමට හෝ අමුතු කිරීමට හෝ පාරිභෝගිකයාට නියම කළ හැකිසි. එකී වෙනස් කිරීම් හා අමුතු කිරීම් විධිමත් පරිදි කළහොත් විදුලි කම්බි සවිකිරීම එකී නිලධාරියා විසින් නැවත පරීක්ෂාකොට හා සෝදිසිකොට බලා නියම පිළිවෙලට ඒවා සවිකර තිබෙන බව පෙනුනොත් එම ස්ථානයට විදුලි බලය සපයනු ලැබේ.

15. බලපත්‍රධාරියාට කලින් දැන්වීමක් නොකරද, ඔහුගෙන් අවසරයක් ලබා නොගෙනද, බලපත්‍රධාරියාගේ විද්‍යුත් වේගවාහක ප්‍රධාන කම්බියට සවිකර ඇත්තාවූ විදුලි කම්බි උපකරණ ආදිය පිළිබඳව යම්කිසි දීර්ඝකිරීමක් කිසියම් විදුලිකටයුතු පිළිබඳ කොන්ත්‍රාත්කරුවෙකු විසින් කරගෙන යනු ලබන විට සම්පූර්ණ සවිකිරීම බලපත්‍රධාරියාගේ විද්‍යුත් වේගවාහක ප්‍රධාන කම්බියෙන් වෙන් කරනු ලැබීමට යටත්වනු ඇත.

16. කිසියම් විදුලි කර්මාන්තයක් නැවත සම්බන්ධ කිරීම සඳහාවූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම බලපත්‍රධාරියා විසින් ඒ සඳහා සපයනු ලබන ෆෝර්මයේ ප්‍රකාරයට විය යුතුවක් හැර, විදුලි බලය අවශ්‍ය වන්නට පැය හතලිස් අටකට නොඅඩු කාලයකට ප්‍රථම එය බලපත්‍රධාරියාගේ කාර්‍යාලය වෙත ඉදිරිපත් කළයුතුද වන්නේ ය.

9300

## ගම්සභා ආඥපනත—198 වැනි පරිච්ඡේදය

රත්නපුර දිස්ත්‍රික්කයේ දියපොට ගම්පත්තු ගම් ප්‍රදේශයේ ගම්කායඞ සභාව විසින් පහත සඳහන් යෝජනාව සම්මත කරගත් බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. ජේ. ආර්. දිසානායක,
සභාපති තැන.

ගම්කායඞ සභා කායඞාලය,
ඇඹිලිපිටිය,
1960 සැප්තැම්බර් මස 15 වැනි දින.

### යෝජනාව

1952කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා ආඥපනතේ 3 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ දියපොට ගම්පත්තු ගම් ප්‍රදේශයේ ගම්කායඞ සභාව විසින් 1953ක් වූ අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පල කරන ලද යෝජනාවෙන් සම්මත කරගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා 4 වැනි කාණ්ඩයේ (1) වැනි අතුරු ව්‍යවස්ථාවේ ප්‍රකාර මෙයින් පහත සඳහන් මංමාවත් එකිනෙක ඉදිරියෙන් සඳහන් දිග පළල අනුව සාද හෝ නැවත සාද පවත්වාගෙන යනු ලබන බව මෙයින් යෝජනා කරනු ලැබේ :—

| පාරේ අංකය | පාරේ නම | දිග හැ. | දිග ද. | පළල අඩි | පාර සඳහා වෙන් කළ බිම් ප්‍රමාණය අඩි |
|---|---|---|---|---|---|
| 1. | කැල්ල-ගින්නෙලිය පාර ... | 4 | — ... | 20 ... | 40 |
| 2. | නාගහවත්ත-මොරවක් කෝරළේ මායිම දක්වා පාර ... | 1 | — ... | 7 ... | 14 |
| 3. | කෝපකන්ද-යොන්දෙහිගහ පඳුර පාර ... ... | 2 | — ... | 7 ... | 14 |
| 4. | කෝපකන්ද - කබරගල - මොරවක් කෝරළේ මායිම දක්වා පාර ... | 2 | — ... | 7 ... | 14 |
| 5. | කෝපකන්ද-අඹේමුල්ල පාර ... | — | 40 ... | 6 ... | 12 |
| 6. | කජුගහලියද්ද-හිඟුරකන්ද පාර ... | 1 | 40 ... | 7 ... | 14 |
| 7. | කැම්පනේ-දඩයම්කන්ද පාර ... | 3 | — ... | 14 ... | 30 |
| 8. | කැම්පනේ-මුල්ඇඩියාවල පාර ... | 6 | — ... | 14 ... | 30 |
| 9. | දඩයම්කන්ද-දියපොට පාර ... | 2 | — ... | 12 ... | 24 |
| 10. | රත්ගල්කන්ද-දියපොට පාර ... | 2 | — ... | 12 ... | 24 |
| 11. | අලහේන්තැන්න අම්බලම-දඩයම් කන්ද පාර ... ... | 2 | — ... | 7 ... | 14 |
| 12. | විසම්තුර-බුලක්වැල්කන්ද පාර ... | 1 | — ... | 7 ... | 14 |
| 13. | පුස්සැල්පිටිය අම්බලම-දියපොට පාර ... ... | 2 | — ... | 12 ... | 24 |
| 14. | දියපොට-ගොඳුවලියද්ද පාර ... | 2 | — ... | 6 ... | 12 |
| 15. | ගමකන්ද-වළල්ගොඩ පාර ... | 2 | — ... | 7 ... | 14 |
| 16. | හෙල්වල-තෝරකොළයාය පාර (ඇඹිලිපිටිය-පනාමුරේ ප්‍රසිද්ධ පාරේ 3 වැනි සැතපුම් කණුව දක්වා) ... ... | 6 | — ... | 12 ... | 24 |
| 17. | දඩුහැතැප්ම-අඹගහවේල්ල පාර ... | 3 | — ... | 8 ... | 16 |
| 18. | පණාමුරේ-රංචිමඩම පාර ... | 3 | — ... | 12 ... | 24 |
| 19. | පණාමුරේ - කරඳකැටිය - අඹගහ වේල්ල පාර ... ... | 2 | — ... | 12 ... | 24 |
| 20. | පණාමුරේ වලව්වත්ත-මහයාය පාර | 2 | 40 ... | 12 ... | 24 |
| 21. | සුදු ගලගාවා-බුලත්වැල්කන්ද පාර | 1 | 40 ... | 12 ... | 24 |
| 22. | 104 සැතපුම් කණුව-කිරළවැල්කටුව පාර ... ... | 1 | — ... | 12 ... | 24 |
| 23. | පල්ලෙගම (ප්‍ර. පාරේ සිට) ගල ගෙඩිආර-වළවේගහ දක්වා පාර | 3 | — ... | 14 ... | 30 |
| 24. | ඇඹිලිපිටිය-තලාව පාර ... | 7 | — ... | 14 ... | 30 |
| 25. | ඇඹිලිපිටිය-පණාමුර ප්‍ර. පාරේ සිට රොඩීගලගුරුආර පාර ... | 2 | — ... | 12 ... | 24 |
| 26. | තුංකම-කච්චිගල පාර ... | 3 | — ... | 20 ... | 40 |
| 27. | කච්චිගල-හිඟුර පාර ... | 2 | 40 ... | 14 ... | 30 |
| 28. | පදලංගල-දික්වැව පාර ... | 1 | 40 ... | 12 ... | 24 |
| 29. | මාදම්පේ-හම්බන්තොට ප්‍ර. පාරේ සිට කුට්ටිගල පාර ... | — | 60 ... | 12 ... | 24 |
| 30. | ලියන්ගස්තොට-109 සැතපුම් කණුව දක්වා පාර ... ... | 5 | — ... | 14 ... | 30 |
| 31. | තුංකම-දෙමෝදර පාර ... | 3 | — ... | 14 ... | 30 |
| 32. | තුංකම-හාගල-තෙරුන්නාන්සේගම පාර ... ... | 3 | — ... | 14 ... | 30 |
| 33. | කෝපකන්ද-හුණුගල-වළකඩ පාර | 3 | — ... | 8 ... | 16 |
| 34. | වළල්ගොඩ-ඕමල්පෙ-දපනේ පාර | 10 | — ... | 20 ... | 40 |
| 35. | පුස්සැල්පිටිය අම්බලම-වළල්ගොඩ වාරිමාර්ග ඇල දක්වා පාර ... | 2 | 40 ... | 12 ... | 24 |
| 36. | ඕමල්පේ-කකුළුඇල පාර ... | 3 | — ... | 14 ... | 30 |
| 37. | තුංකම-කච්චිගල පාරේ සිට කච්චි ගල පාසල පාර ... | — | 60 ... | 14 ... | 30 |

9146

---

## ගම්සභා ආඥපනත—198 වැනි පරිච්ඡේදය

### උඩපළාත ගහපහල ගම් ප්‍රදේශයේ ගම්කායඞ සභාව

මහනුවර දිස්ත්‍රික්කයේ උඩපළාත ගහපහල ගම්ප්‍රදේශයේ ගම්කායඞ සභාව විසින් පහත සඳහන් යෝජනාව සම්මත කරගත් බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. බී. හේරත්,
ගහපහල ගම්කායඞ සභාවේ සභාපති තැන.

ගහපහල ගම්කායඞ සභා කායඞාලය,
ගල්ගෙඩියාව, ගම්පොල.
1960.9.12.

### යෝජනාව

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා ආඥපනතේ 3 වැනි වගන්තියේ ''1'' වැනි උප වගන්තිය යටතේ උඩපළාත ගහපහල කෝරළයේ ගම්ප්‍රදේශයේ ගම්කායඞ සභාව විසින් 1955ක්වූ ජූනි මස 17 වැනි දින අංක 10,809 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පල කරන ලද යෝජනාවෙන් සම්මත කරගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 4 වැනි කාණ්ඩයේ ''1'' වැනි අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර මෙහි පහත සඳහන් මංමාවත් එකිනෙක ඉදිරියෙන් සඳහන් දිග හා පළල අනුව සාද හෝ නැවත සාද පවත්වාගෙන යනු ලබන බව මෙයින් යෝජනා කරනු ලැබේ :—

| පාරේ අංකය | පාරේ නම | දිග හැ. | දිග ද. | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|---|---|
| 1. | සඳසිරිය-හපුගස්පිටිය පාර ... | 0 | 37 | 0 ... | 16 |
| 2. | හපුගස්පිටිය-වනවාස පන්සල පාර ... | 0 | 20 | 30 ... | 8 |
| 3. | පොකුණුවලේ පාර ... ... | 0 | 18 | 0 ... | 6 |
| 4. | යකඩාදෙනිය පාර ... ... | 0 | 9 | 56 ... | 6 |
| 5. | අලපලාවල ළිඳට යන පාර ... | 0 | 11 | 0 ... | 6 |
| 6. | ගැටනේ ළිඳට යන පාර ... ... | 0 | 15 | 0 ... | 6 |
| 7. | හපුගස්පිටිය-සිංහයාපිටිය පාර ... | 0 | 12 | 0 ... | 6 |
| 8. | සිංහයාපිටිය-රත්මලකඩුව හාට්පිල්ඩ් හරහා වැවපිටියට යන පාර ... ... | 2 | 25 | 0 ... | 16 |
| 9. | සිංහයාපිටිය වත්තේ උඩපාර ... | 1 | 0 | 0 ... | 16 |
| 10. | වෙල්ලන්ගිරියේ ළිඳට යන පාර ... | 0 | 45 | 0 ... | 6 |
| 11. | අසුරමානයා කුඹුරේ ළිඳට යන පාර ... | 0 | 5 | 37 ... | 6 |
| 12. | ගැටනේ ළිඳට යන මගුරුවල පාර ... | 0 | 8 | 0 ... | 6 |
| 13. | ඉලංගන්වත්ත-හඳිරම-ඉත්තවල පාර ... | 0 | 32 | 0 ... | 16 |
| 14. | අඹකොටේ-උඩකුඹුරේ පාර ... | 0 | 25 | 0 ... | 6 |
| 15. | කහටපිටිය-අප්පල්ලාගොඩ පාර ... | 0 | 26 | 0 ... | 8 |
| 16. | දවුලාව පාර ... ... | 0 | 12 | 0 ... | 8 |
| 17. | ඉත්තවැල-බැබිල පාර ... ... | 0 | 56 | 0 ... | 8 |
| 18. | කහටපිටිය-උඩුවැරැල්ල පාර ... | 0 | 21 | 0 ... | 6 |
| 19. | ලුනුවත්ත පාර ... ... | 0 | 8 | 0 ... | 6 |
| 20. | ඕවිට වත්තේ පාර ... ... | 0 | 22 | 0 ... | 6 |
| 21. | උඩඅස්වැද්දුම දෙල්ගහයට පැල පාර ... | 0 | 32 | 0 ... | 6 |
| 22. | ඕවිටවත්ත-කිරින්ද පාර ... ... | 0 | 31 | 0 ... | 8 |
| 23. | හින්නාරන්දෙනිය-උඩෝවිට-ඇල්පිටිය පාර | 1 | 03 | 0 ... | 10 |
| 24. | උඩෝවිට දඹගහයට පාර ... | 0 | 35 | 40 ... | 8 |
| 25. | නුගමුල්ලේ තොටපලට යන පාර ... | 0 | 06 | 0 ... | 6 |
| 26. | උඩෝවිට-කහටපිටිය පාර ... | 0 | 30 | 38 ... | 8 |
| 27. | බෝකොටුව අලුත්වත්ත පාර ... | 0 | 25 | 0 ... | 8 |
| 28. | උඩෝවිට විහාරය හරහා ගඟට යන පාර ... | 0 | 12 | 8 ... | 8 |
| 29. | ඇල්පිටිය ගම මැද පාර ... ... | 0 | 64 | 0 ... | 10 |
| 30. | ඇල්පිටිය-කලුගමුව පාර ... | 0 | 47 | 0 ... | 12 |
| 31. | ඇල්පිටිය පොල්ගහඅංග පාර ... | 0 | 12 | 58 ... | 8 |
| 32. | පුස්සෙකොට පාර ... ... | 0 | 4 | 0 ... | 10 |
| 33. | වෙලකදෙනියේ ළිඳට යන පාර ... | 0 | 2 | 33 ... | 6 |
| 34. | කබුල්කඩුවේ ළිඳට යන පාර ... | 0 | 2 | 18 ... | 6 |
| 35. | අලුපොත-බැබිල-හොඩියාදෙනිය පාර ... | 0 | 60 | 0 ... | 14 |
| 36. | හින්නාරන්දෙනිය-ගුරුගල්වල පාර ... | 0 | 46 | 46 ... | 16 |
| 37. | ගල්ගෙඩියාව-බෝමලුව පාර ... | 0 | 25 | 30 ... | 10 |
| 38. | උඩගේවත්ත-ගුරුගල්වල පාර ... | 0 | 7 | 0 ... | 8 |
| 39. | ගංහත කිරින්ද පාර ... ... | 0 | 50 | 0 ... | 8 |

| පාරේ අංකය | පාරේ නම | දිග හැ. | දිග ද. | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|---|---|
| 40. | කිරින්ද ඉහල විහාරේ පාර | 0 | 19 | 46 | 10 |
| 41. | නිකදෙනිය-කිරින්ද පාර | 0 | 23 | 22 | 8 |
| 42. | කිරින්ද අලුදෙනිය පාර | 0 | 13 | 8 | 8 |
| 43. | හින්නාරන්දෙනිය-කිරින්දේවෙල පාර | 0 | 7 | 0 | 8 |
| 44. | ලියන්ගහදෙල පාර | 0 | 64 | 18 | 14 |
| 45. | නාගහහින්න පාර | 0 | 60 | 15 | 14 |
| 46. | ගුරුදෙනිය පාර | 0 | 45 | 0 | 14 |
| 47. | පද්දදෙනිය පාර | 0 | 31 | 0 | 8 |
| 48. | හුනුගල පාර | 0 | 12 | 9 | 8 |
| 49. | දෙඩන්දෙනිය වේගාල පාර | 0 | 65 | 18 | 8 |
| 50. | උඩගම්මැද්ද පාර | 0 | 8 | 0 | 8 |
| 51. | දිය ඇල හදිරම පාර | 1 | 0 | 0 | 12 |
| 52. | දිය ඇල කටුලියද්ද පාර | 0 | 52 | 16 | 14 |
| 53. | මිරිහන්දෙනිය-දික්කුඹුර පාර | 0 | 29 | 9 | 8 |
| 54. | හැවැන්දෙනිය බෝමලුව පාර | 0 | 15 | 0 | 8 |
| 55. | තොටුපොලංග පන්සලේවත්ත පාර | 0 | 8 | 0 | 8 |
| 56. | රදකුඹුරේ පාර | 0 | 5 | 0 | 6 |
| 57. | කහකොටුව කැටවලවත්ත පාර | 0 | 12 | 3 | 8 |
| 58. | ඉලුක්ගැටේ ගුනලෝකේ පාර | 0 | 4 | 30 | 8 |
| 59. | දික්කුඹුර අගුරුවල පාර | 0 | 59 | 26 | 8 |
| 60. | දෙහිගහතැන්න බලදෙර පාර | 0 | 38 | 0 | 10 |
| 61. | ඇඹිල්මීය හපුතැන්න පාර | 0 | 8 | 0 | 8 |
| 62. | බෝවල අලුගොල්ලේ මඩ පාර | 1 | 0 | 0 | 8 |
| 63. | රණවලවත්තේ පාර | 0 | 11 | 24 | 8 |
| 64. | දෙහිගහතැන්න-කටුලියද්ද පාර | 0 | 12 | 0 | 8 |
| 65. | වැවපිටිය-සිංහයාපිටියේ උඩ කොටස පාර | 1 | 0 | 0 | 14 |
| 66. | හාටපිල්ඩ මාවිකුඹුර පාර | 0 | 35 | 40 | 12 |
| 67. | සිංහයාපිටියේ සිට අපර් සිංහයාපිටියට යන පාර | 3 | 0 | 0 | 14 |
| 68. | දෙල්ගහවත්ත පාර | 0 | 5 | 0 | 6 |
| 69. | තැඹේ ළිදට යන පාර | 0 | 7 | 0 | 6 |

9149

## ගල්බඩ කෝරළේ ගම්කායර්‍ය සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (201 වන පරිච්ඡේදය) 13ඒ වගන්තිය යටතේ නිකුත් කෙරෙන නියෝගයයි**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (201 වන පරිච්ඡේදය) 13 ඒ දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලයේ ප්‍රකාර නිසි බල ධාරියාවූ, කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බඩ කෝරළේ ගම්කායර්‍ය සභාවේ සභාපති මුහන්දිරම් රාළලාගේ බණ්ඩාර දස්වත්ත වන මම, 1960 සැප්තැම්බර් මස 26 වන දින ගල්බඩ කෝරළේ ගම් ප්‍රදේශය ඇතුළත මස් පිණිස සතුන් මැරීම මෙයින් තහනම් කරමි.

ඇම්. ආර්. බී. දස්වත්ත,
ගල්බඩ කෝරළේ ගම්කායර්‍ය සභාවේ
සභාපති තැන.

1960 සැප්තැම්බර් මස 16 වැනි දින,
ගම්කායර්‍ය සභා කායර්‍යාලය,
මාවනැල්ල.

9293

## එගොඩපොත ගම්කායර්‍ය සභාව

**1951 අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ (සංශොධිත) ආඥපනත**

1951කේ අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ (සංශොධිත) ආඥපනතේ 13ඒ (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත අධිකාරි තැනවූ කොළඹ දිස්ත්‍රික්කයේ එගොඩපොත ගම්කාර්‍ය සභාවේ සභාපති ජෝශප් පෙරේරා වීරසිංහ වන මම, හිටපු අගමැති ගරු ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායකතුමා අභාවප්‍රාප්තවී පුරා වසක් ගෙවෙන දිනය අනුස්මරණය කිරීම නිමිත්තෙන් වෂී 1960ක්වූ සැප්තැම්බර් මස 26 වෙනි දින එගොඩපොත ගම්කායර්‍ය සභා ප්‍රදේශය ඇතුළත මස් පිණිස සතුන් මැරීම හා මස් විකිණීම සම්පූර්ණයෙන්ම මෙයින් තහනම් කරමි.

ජේ. පී. වීරසිංහ,
එගොඩපොත ගම්කායර්‍ය සභාවේ
සභාපති.

1960 සැප්තැම්බර් මස 16 වැනි දින,
ගම්සභා කායර්‍යාලය,
නිට්ටඹුව.

9309

# තනතුරු – ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**1. දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී, ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, 1946 අංක 5 දරන පළාත් පාලන සේවා (සංක්‍රමණ විධිවිධාන) ආඥපනතින් සංශෝධනය කරන ලද 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥපනතේ විධිවිධාන වලට ද 1945 අංක 43 දරන ආඥපනත පිළිබඳව තවදුරටත් කෙරෙන සංශෝධන වලට ද ඒ ආඥපනත යටතේ සාදනු ලබන රෙගුලාසිවලට ද එසේ ම කොමිෂන් සභාව විසින් කලින් කල නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසි වලට ද යටත් වන්නේ ය.

**3. සේවයට බාරගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 8 වැනි දිනය හා 10,432 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරන ලද උපලෙඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලෙඛනයට එකතු කරන අනිත් තනතුරු ද ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සාමාජිකයන් විසින් උසුලනු ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේ ය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා වල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරු කර හරිනු ලැබුවහොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හෝ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේ දී සේවයෙන් විශ්‍රාම ගැනීමේ දී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ, 1949 අංක 8 දරන පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින් ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශික බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුව ය.

(ඇ) ස්ත්‍රීන් ද, වයස 55ට වැඩි නිලධාරීන් ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින් ද ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට පත් කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා අංක 10,429 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට සවකීය වැටුපෙන් සියයට 4ක දයක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බල මණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3ක දයක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බල මණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක්, මුදලින් හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත්වන්නන්ට නියම කළ හැකි ය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනට ම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට, දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් මවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම දෙවර්ෂයක ආධුනික කාලයකට හෝ දෙවර්ෂයකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් විසින් ස්වකීය වයස තහවුරු කිරීම පිණිස උප්පැන්න සහතික පිටපත් අමුණා එවිය යුතුයි. දිවුරුම් පෙත්සම් නො පිළිගනු ලැබේ. උප්පැන්න සහතික පිටපත් අමුණා නැති කල්හි අයදුම්කරුවෝ සුදුසුකම් නැත්තවුන් ලෙස සලකනු ලැබෙති.

4. නව ප්‍රවේශක නිලධාරීහු.—(i) අදාළ පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියම කොට නැතිනම්, අවුරුදු 2ක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත්, විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත් මෙතෙක් සම්පාදිත නියෝග හෝ මින් මතු සම්පාදනය කළ හැකි නියෝගවලටත් අනුකූලව ක්‍රියා කරන ලෙස "නව ප්‍රවේශක නිලධාරීන්ට" නියම කරනු ලැබෙයි.

(iii) (අ) ස්වකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුළතදී සිංහල භාෂාව විෂයයෙහි ප්‍රවීණතාවක් ලබාගන්නා ලෙස මේ නිලධාරීන්ට නියම කරනු ලැබෙයි.

(ආ) ඔවුන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසාන යේදී තනතුරුවල ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර සිංහල ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම උඩ රඳා පවතී.

ස්වකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුළතදී සිංහල භාෂා ප්‍රවීණත්වයෙහි ලා නියමිත තත්ත්වයට පැමිණීමට නොහැකි වන නිලධාරීන්ගේ සේවය නැවැත්විය හැකිය. එහෙත්, රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් ලැබීම සඳහා අවංක ප්‍රයත්නයක් දරා ඇති බවට පළාත් පාලන සේවා කොමිෂන් සභාවට සෑහීමකට පත් විය හැකි නම් එසේ සේවය නතර කිරීම කල් දැමිය හැකිය. නියමිත දිනයෙන් පසු සාධාරණ කාල පරිච්ඡේදයක් ඇතුළතදී නිලධාරියා පරීක්ෂණයෙන් සමත් වුවහොත්, කොමිෂන් සභාවේ අභිමතය පරිදි, ජ්‍යෙෂ්ඨතාව සම්බන්ධයෙන් වූ පාඩුව නොසලකා හැරිය හැකිය.

(iv) පළාත් පාලන සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබාගන්නා "නව ප්‍රවේශක නිලධාරීහු" සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙති.

සටහන.—මේ කරුණ සම්බන්ධයෙන් "නව ප්‍රවේශක නිලධාරී" යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන් ය.

5. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකු විසින් ම, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතු ය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

6. යුද්ධ සේවා අනුග්‍රහය.—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම ආකාරයකින් ම සුදුසුකම් ලැබ සිටින මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූ අයට ද, සහාය ගිනි නිවීම සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිට සිය කැමැත්තෙන්ම සේවයෙන් අස්වූවන් හැර සෑම කෙනෙකුටම ද, ඔව්හු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස, නො කඩවා සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දිනත්, ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මේදතුර තමන් එසේ සේවයේ යෙදී සිටි කාල පරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. වයස පිළිබඳ අනුග්‍රහය.—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට පුළුවන.

8. ප්‍රසිද්ධ කොට ඇති තනතුරෙහි පන්තියට හා ශ්‍රේණියට ම අයත් වන තනතුරු උසුලන පළාත් පාලන සේවා සාමාජිකයන්ට අධ්‍යාපන සුදුසුකම් නො තකා, පළ කොට ඇති ඇබෑර්තුවට මාරු වී යාම සඳහා අයදුම් පත් එවිය හැකි ය.

9. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් තම තමන් සේවය කරන ප්‍රාදේශික බල මණ්ඩලයේ සභාපති මඟින් හෝ නාගරික කොමසාරිස්වරයා මඟින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරන නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරා ගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරු වලින් මුදාහරින්ට තමන් සූදානම් ව සිටිත් ද නැද්දැයි සඳහන් කළ යුතු යි.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයන් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iv) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම් පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම්, රාජකාර්යයෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) අයදුම් පත් වනාහි මීට යා කොට ඇති ආකෘතියට සාරානුකූලව පිළියෙළ කොට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අවසාන දිනට පසු මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලසා බලනු නො ලැබේ.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම් පතේ ආකෘතිය

### පළාත් පාලන සේවය

සැ. යු.—(i) අයදුම් පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙළ කොට, තනතුරට අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර සභාපතිගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම් පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියළුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) උප්පැන්න සහතිකය, (2) ඉංග්‍රීසි/සිංහල/දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (3) චරිත සහතිකය, (4) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වේ නම් වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතික.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 9 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

———— තනතුරු සඳහා වූ අයදුම් පතයි (——)

1. පුරප්පාඩුව ප්‍රසිද්ධ කොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරින් :————.

ජාතිය :————.

(ඔබ ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැඳහුම් අංකයත් සඳහන් කරන්න).

3. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි).

4. (අ) අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට නියම වයස: අවුරුදු———, මාස———, දින———.

(ආ) උපන් දිනය:—

| අවුරුද්ද | මාසය | දිනය |
| --- | --- | --- |
| | | |

5. උපන් ස්ථානය—

(අ) අයදුම්කරු :———.

(ආ) අයදුම්කරුගේ පියා :———.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :———.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :———.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ආ) සහ (ඈ) හෝ පිරවිය යුතුයි).

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :———.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :———.

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය | | |
| --- | --- | --- | --- | --- | --- |
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | විද්‍යායතනය | සිට | දක්වා |
| 1. | | | 1. | | |
| 2. | | | 2. | | |
| 3. | | | 3. | | |
| 4. | | | 4. | | |
| 5. | | | 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග—

(අ) සිංහල :———.

(ආ) ඉංග්‍රීසි :———.

(ඇ) දෙමළ :———.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ/හෝ ශිල්පීය සුදුසුකම්, ලැබූ දින හා ආයතනවල නම් :———.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :———.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත්වූ දිනයන් හා අස්වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :———.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය යම් කලක නතර කරන ලද්දේ නම් එසේ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :———.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන (තනතුරු, පළාත් පාලනායතන හා කාලසීමාවන්) : ———.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය :———.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය : ———.

(iii) විශ්‍රාම වැටුප් සහිත ද :———.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—

සේනාංකය, තරාතිරම, සේවයට බැඳුණ දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :———.

12. කියවීම, ලිවීම, කතා කිරීම හා භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද ? :———.

(අ) සිංහල :———.

(ආ) දෙමළ :———.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශෙෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර දින වකවානු සහිතව සඳහන් කරන්න :———.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මඟින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :———.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :———.

16. වෙනත් විස්තර (විශෙෂ හිමිකම් ආදිය) :———.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :———. (ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ).

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි, මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

———————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### කිරම ගම්කාර්ය සභාවේ පියුන් තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය :—වර්ෂයකට රු. 540—22 × 12—රු. 804; රු. 636 සහ 732 වාර්ෂික වැටුප්වලට පළමු කාර්යක්ෂමතා කඩඉම්.

3. අවශ්‍ය සුදුසුකම් :—

(අ) වයස :— 1960 සැප්තැම්බර් මස 23 වැනි දිනට වයස අවුරුදු 20ට නොඅඩු 30ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල 5 වැනි ප්‍රමාණයෙන් හා ඉංග්‍රීසි 3 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුත්තාහ.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බල මණ්ඩලවල ස්ථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම් පත්‍ර, ඔවුන් අනික් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ 4 වැනි කොටසේ ආරම්භයෙහි පළ කර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට, 1960 සැප්තැම්බර් මස 30 වැනි දිනට හෝ ඊට පළමු කිරම ගම්කායයී සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි.

පී. බී. ජුලියස්,
කිරම ගම්කායයී සභාවේ
සභාපති.

1960 අගෝස්තු මස 31 වැනි දින,
කටුවාන, කිරම ගම්සභා කාර්යාලයේදීය.

8786

## පළාත් පාලන සේවය

### පළාත් පාලන සේවයේ දෙවැනි ශ්‍රේණියේ කාන්තා ආයුර්වේද වෛද්‍ය තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා, පළාත් පාලන සේවා කොමිෂන් සභාව කාන්තාවන්ගෙන් පමණක් ඉල්ලුම් පත්‍ර කැඳවයි. තෝරා ගනු ලැබූ අපේක්ෂිකාව පළමුවරට කළුතර පළාත් ආණ්ඩු සභාවට පත් කර යවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය : වර්ෂයකට රු. 960—17 × 72—රු. 2,184 ; එහි රු. 1,608 වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක් ඇත්තේ ය.

3. අවශ්‍ය සුදුසුකම් :—

(අ) අයදුම්කරුවෝ, 1949 අංක 49 දරණ දේශීය වෛද්‍ය සංශෝධන ආඥාපනතේ දෙවැනි වගන්තිය යටතේ ලියා පදිංචි කරනු ලැබුවෝ විය යුත්තාහ.

(ආ) අයදුම්කරුවන්ට ලංකා සවදේශීය වෛද්‍ය විද්‍යාලයයේ සවදේශීය වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය කර්ම විධි පිළිබඳ ඩිප්ලෝමා සහතිකය හෝ ඊට සමාන සහතිකයක් හෝ ලංකාවේ හෝ ඉන්දියාවේ පිළිගත් ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයක වඩා උසස් සහතිකයක් හෝ තිබිය යුතු අතර, ඩිප්ලෝමා සහතිකය ලැබීමෙන් පසු සාමාන්‍ය ආයුර්වේද වෛද්‍යවරයකු ලෙස අවුරුදු 7කට නො අඩු කාලයක් වෛද්‍ය කර්මයෙහි යෙදී සිටි පළපුරුද්ද තිබිය යුතුයි. 1953 සැප්තැම්බර් මාසයෙන් පසු අවසාන පරීක්ෂණයෙන් සමත් වී අළුත් අධ්‍යයන පරිපාටිය සම්පූර්ණ කළ ඩී. අයි. ඇම්. සහ ඇස් (ලංකා) උපාධිධරයින් සම්බන්ධයෙන් ඩිප්ලෝමා සහතිකය ලැබීමෙන් පසු පළපුරුද්ද තිබීම අවශ්‍ය නොවේ.

(ඇ) සුප්‍රසිද්ධ ගුරු වෛද්‍යවරයකු යටතේ යටත් පිරිසෙයින් පස් වර්ෂයක ශිෂ්‍ය භාවයෙහි යෙදීමෙන් පසු සාමාන්‍ය ආයුර්වේද වෛද්‍යවරියක ලෙස වර්ෂ දහයකට නොඅඩු කාලයක් තුළ කරන ලද ව්‍යාප්ත වෛද්‍ය අභ්‍යාසයක් ඇති පිළිගත් සාමාන්‍ය ආයුර්වේද වෛද්‍යවරියන්ගේ ඉල්ලුම් පත්‍ර ද මීට ඉහතින් සඳහන් කරන ලද සුදුසුකම් නොතකා සලකා බලනු ලැබේ. එබඳු අයදුම්කරුවෝ සවකීය අයදුම් පත්‍ර සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරියාගෙන් සහ ගුරු වෛද්‍යවරයාගෙන් ලබාගත් සහතික ද ඉල්ලුම් පත්‍රවලට ඇමිණිය යුත්තාහ.

4. තෝරා ගනු ලැබූ අපේක්ෂිකාවට පෞද්ගලික වෛද්‍ය කර්මයෙහි යෙදීමට අවසර නැත. ආයුර්වේද බෙහෙත් ශාලාවන්ට ආසන්නයෙහි පදිංචි වන ලෙස ඇයට නියම කරනු ඇත.

5. අයදුම්කරුවෝ සවකීය ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් ලිපි පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බව්තීස්ම සහතිකය හෝ ආධාර ලබන පාඨශාලාවල රෙගුලාසි පද්ධතිය වෙනුවෙන් නිකුත් කරන ලද සහතික හෝ දිව්රුම් පෙත්සම් නොපිළි ගනු ලැබේ.)

(ආ) සාමාන්‍ය ආයුර්වේද වෛද්‍යවරියක ලෙස වෛද්‍ය කර්මයෙහි යෙදීමේ පළපුරුද්ද පිළිබඳව ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරියාගේ සහතිකය (එහි පළපුරුද්ද පිළිබඳ කාල පරිච්ඡේදය සඳහන් විය යුතුයි.)

6. මේ ගැසට් පත්‍රයේ 4 වැනි කොටසේ ආරම්භයෙහි පළ කර තිබෙන පළාත් පාලන සේවා තනතුරුවලට පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

7. ඉල්ලුම් පත්‍ර, පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි යටතේ සඳහන් කොට ඇති ආකෘති පත්‍රයෙහි සාරානුකූලව පිළියෙල කොට 60. 10. 7 දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. පූර්වෝක්ත ආකෘති පත්‍රයෙහි 13 වැනි ශීර්ෂය වෙනුවට පහත සඳහන් කොට ඇති කරුණු යොදා ගත යුතුයි.

"13. (i) සුදුසුකම් ලැබීමෙන් පසු සාමාන්‍ය ආයුර්වේද වෛද්‍යවරියක ලෙස වෛද්‍ය කර්මයෙහි යෙදීම ආරම්භ කළ දිනය. (එය සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අමුණන්න) :————.

(ii) ආයුර්වේදයේ එක්තරා අංශයක් විශේෂයෙන් අධ්‍යයනය කළේ ද ? එසේ නම් විස්තර දක්වන්න : ————.

(iii) ආයුර්වේද පිළිබඳ සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුයි.) :————.

(iv) සුදුසුකම් ලැබූ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ නම : ————.

(v) සුදුසුකම් ලැබූ දින :————.

(vi) 1949 අංක 49 දරණ සවදේශීය වෛද්‍ය සංශෝධන ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ ලේඛනයෙහි හෝ සාමාන්‍ය ලේඛනයෙහි ලියා පදිංචි වූ අංකය :————.

8. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ යම්කිසි නිලධාරියකුගේ පෞද්ගලික නමට නොවේ.

9. නියමිත දිනයට පසුව, රජයේ සේවයේ හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයක සේවය කරන නිලධාරීන්ගෙන් මේ කාර්යාලයට ලැබෙන අයදුම් පත්‍ර, නියමිත දින හෝ ඊට පළමු ඒ දෙපාර්තමේන්තු ප්‍රධානියා, නාගරික කොමසාරිස්වරයා, ප්‍රාදේශීය බල මණ්ඩලයේ සභාපති වෙත ලැබී ප්‍රමාදය පිළිගත හැකි හේතු දක්වමින් ඒ අයදුම් පත්‍ර පිළිගන්නා ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා, නාගරික කොමසාරිස්වරයා හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයේ සභාපති විසින් නිර්දේශ කරනු ලැබුව හොත් මිස, සලකා බලනු නොලැබේ.

10. සියළුම ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට දින හතක් ඇතුළත සවකීය ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු නොලැබුවහොත්, ඒ බව වහාම පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දන්වා එවිය යුතුයි. මේ විධි විධානයට අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත් ඉල්ලුම් පත්‍රය සළකා බැලීම සඳහා කිසියම් හිමිකමක් වෙයිනම් එය නැතිවී යන්නේ ය.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
වැඩ බලන සභාපති.

1960 සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹ, තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.

9335

# අය-වැය ලේඛන

## හොරණ පළාත් ආණ්ඩු සභාව

### 1960 වර්ෂයේ තුන්වන අතිරේක අය වැය ලේඛනය

| වැය ශීර්ෂය හා අනු ශීර්ෂය | මුදල රු. ශ. | අවසරය |
| --- | --- | --- |
| (ඒ) සාමාන්‍ය වියදම : | | |
| (2) කායයී මණ්ඩලීය වියදම් | | |
| (එච්) කරත්ත හා බෝට්ටු තහඩු ගාස්තු | 100 0 … | 30.7.60 වන දින යෝජනා අංක 5 |
| (බී) මහ මාර්ග : | | |
| (12) නව කර්මාන්ත … | 655 0 … | 6.8.60 වන දින යෝජනා අංක 17 |
| (ජේ) විදුලි බල කායයාංශය : | | |
| (2) ප්‍රතිසංස්කරණය හා නඩත්තු කිරීම | | |
| (ඩී) වේග සම්පාදක ප්‍රධාන කම්බි විදුලි වාහක කම්බි නඩත්තු කිරීම | 4,250 0 … | 6.8.60 වන දින යෝජනා අංක 16 |
| (4) පාලනය හා සාමාන්‍ය වියදම් | | |
| (ඊ) ජීවන හා විශේෂ ජීවනාධාර … | 185 0 … | 30.7.60 වන දින යෝජනා අංක 5 |

1960 ජුලි මස 30 වන දින සහ අගෝස්තු මස 6 වන දින පවත්වන ලද රැස්වීම් වලදී සම්මත කෙරුණි.

ඩබ්ලිව්. ඇම්. ෆොන්සේකා,
සභාපති,
හොරණ පළාත් ආණ්ඩු සභාව.

පළාත් ආණ්ඩු සභා කාර්යාලය,
හොරණ, 7.9.60.

9154

# විවිධ දැන්වීම්

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ බෝයගනේ ගම්කාර්ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අයවලුන් විසින් මස් පිණිස සතුන් මරා එහි දැක්වෙන ස්ථානයන්හි මස් විකිණීම පිණිස 1960 වර්ෂයට බල පත්‍ර ඉල්වා තිබෙන බවත්, මෙම බල පත්‍ර නිකුත් කිරීමට විරුඬව කුරුණෑගල දිස්ත්‍රික්කයේ බෝයගනේ ගම්කාර්ය සභා සීමා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට, තමා ඒ සඳහා විරුඬ වන්නේ අසවල් කරුණ සඳහා යැයි දැක්වෙන ලියවිල්ලක්, පිටපත් දෙකක් සහිතව, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවෙන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ, 1947තේ අංක 44 දරන සංශෝධිත ආඥාපනතේ 6 වැනි වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ගම්කාර්ය සභා කාර්යාලය,
බෝයගනේ, 1960 සැප්තැම්බර් 10.

බී. අරඹේපොල,
සභාපති තැන.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම කරන්ට යන ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. ඇස්. ඒ. රසාක්, නො. 113, නුවර පාර, මල්ලවපිටිය | මතව හන්දිය ... | හරක් මස් |
| 2. ආර්. විලියම් සිංඤෝ, කුරුණෑගල | මල්කඩුවාවේ බුලුගහ වත්ත | හරක් මස් |
| 3. කේ. ඒ. ජබාර්, මල්ලවපිටිය, කුරුණෑගල | මතව හන්දිය, කොර දෙලුගේ වත්ත | හරක් මස් |

9112

---

## නාරම්මල ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය එහි සඳහන් ස්ථානයන්හි 1960 වර්ෂයට මස් කඩ පවත්වා ගෙන යාමට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත්කිරීම ගැන නාරම්මල ගම් කාර්‍ය සභා සීමාව තුළ පදිංචි යම්කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඒ කුමන කරුණක් නිසාද යනවග ඇතුළත් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට සති දෙකක් ඇතුළත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරන ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. ඇම්. ඩී. ජෝෂප් අප්පුහාමි, මාර්කට්, කුලියාපිටිය | අංක 81, බෝගහමුල වත්ත, නාරම්මල | හරක් මස් එළුමස් සහ ඌරු මස් |
| 2. ආනා අබ්දුල් ලතීබු, 5/81, මීගමුව පාර, නාරම්මල | මීගමුව පාරේ අංක 71, නාරම්මල | එළුමස් සහ හරක් මස් |

ගම්කාර්‍යසභා කාර්‍යාලයය,
නාරම්මල, 1960 සැප්තැම්බර් 13.

පී. බී. මැදගොඩ,
නාරම්මල ගම්කාර්‍ය සභාවේ
ප්‍රධාන තැන.

9223

---

## දිඹුල ගම්කාර්‍ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් 1961 වර්ෂයට මස් පිණිස සතුන් මැරීමට හා මස්කඩ පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලුම්කර සිටින බවත් ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන දිඹුල ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි යම්කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුඬ වීමට හේතු සඳහන්කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් මෙම දැන්වීම ගැසට් පත්‍රයෙහි පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ජේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය සහ වෙළඳාම |
|---|---|
| 1. ඇස්. ඒ. ඇන්. සම්සුදීන් ... | හරක් මස් කඩය, වරිපනම් අංක 1, වටගොඩ. |
| 2. ඇස්. ඒ. ඇන්. සම්සුදීන් ... | හරක් මස් කඩය, 34 වෙනි සැතපුම් කණුව, හෝල්බෲක්. |

දිඹුල ගම්කාර්යසභා කාර්යාලය,
කොටගල, 1960 සැප්තැම්බර් 10 දින.

එච්. කේ. මෙන්දිස්
දිඹුල ගම්කාර්ය සභාව.
සභාපති තැන,

9168

ලඞකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.